# සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
# GIT
# 12 ශ්‍රේණිය

## පරිගණක පද්ධතියට එල්ල වන තර්ජන හඳුනා ගනියි




# පරිගණක පද්ධතියකට එල්ල වන තර්ජන

# හානිකර මෘදුකාංග
# Malicious software/Malware



- පරිගණක වෛරස (Computer virus)
- පරිගණක වර්ම්ස් (Computer worms)
- ඔත්තුකරුවන් (Spyware)
- අනවශ්‍ය දැන්වීම් (Adware)
- බොට්ස් (Bots)
- කොල්ලකරුවා (Hijacker/ Browser hijacker)
- ෆිෂින් (Phishing)
- ආයාචිත තැපෑල (Spam)

# පරිගණක වෛරස
# (Computer virus)



පරිගණක වැඩසටහනක් හා සම්බන්ධ වෙමින් පරිගණකය භාවිත කරන්නාගේ අනුදැනුමකින් තොරව ස්වයංක්‍රීයව පැතිර යමින් තමාගේ අනුපිටපත් සාදන වෛරසයකි. මෙය USB flash, මතක තැටි හෝ විද්‍යුත් තැපැල් ඇමුණුම් මගින් පරිගණකය ආක්‍රමණය කරයි.

# පරිගණක වර්ම්ස්
## (Computer worms)



**පරිගණක වර්ම්ස් ද පරිගණක වෛරස හා සමාන ලෙසින් ක්‍රියාකරයි. නමුත් වර්ම්ස්වලට තනිවම ක්‍රියාත්මක වීමේ සහ පැතිරීමේ හැකියාවක් ඇති අතර ඒ සඳහා විද්‍යුත් තැපැල් ඇමුණුම්, ව්‍යාජ වෙබ් අඩවි වැනි උපක්‍රම යොදා ගනු ලැබේ.**

**පරිගණක ජාල හරහා පරිශීලකයාට කිසිදු දැනුම් දීමකින් තොරව පැතිරෙන මෙය බොහෝවිට ඉලක්ක පරිගණකයේ දත්ත විනාශ කිරීම හෝ දූෂිත කිරීම සිදු කරයි.**

# ඔත්තුකරුවන්
## (Spyware)



# ට්‍රෝජන් අශ්වයා (Trojan Horse)

අව්‍යාජ බවක් පෙන්නුම් කරන නමුත් හානිකර මෘදුකාංගයක් වන මෙය පරිශීලකයා නොදැනුවත්වම පද්ධතියට සම්බන්ධ වෙයි. පරිගණකයේ දත්ත හෝ ගොනු මකා දමමින් මුරපද වැනි රහස්‍ය දත්ත සොරකම් කරමින් පරිශීලකයා අපහසුවට පත් කරන ට්‍රෝජන් අනෙකුත් හානිකර මෘදුකාංග පරිගණකයට ඇතුළුවීම සඳහා පහසුකම් සලසයි. ට්‍රෝජන් අශ්වයා පරිගණක වෛරස හා වර්ම්ස් මෙන් බෝවීම සිදු නො කරයි.

# අනවශ්‍ය දැන්වීම්
## (Adware)



අනවශ්‍ය දැන්වීම් පරිගණක තිරයෙහි දර්ශනය කිරීම මෙහිදී සිදුවේ. මෙය පරිගණක වෛරස මෙන් හානිදායක නොවූවත් පරිශීලකයා මානසික වශයෙන් පීඩාවට පත් කරයි.

# බොට්ස්
## (Bots)



රොබොට් (Robot) යන නාමයෙන් උකහා ගනු ලබන බොට්ස් (Bots) යනු අනෙකුත් ජාල සමග සම්බන්ධතා තබාගන්නා ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන හානිකර මෘදුකාංගයකි. ක්ෂණික පණිවුඩ සහ අන්තර්ජාල සංවාද මගින් පෞද්ගලික තොරතුරු රැස් කරගැනීම සඳහා බොට්ස් යොදා ගැනේ.

# කොල්ලකරුවා

## (Hijacker/  Browser hijacker)



වෙළෙඳ, වාණිජ්‍යය සහ වෙළෙඳ ප්‍රචාර කටයුතු සඳහා නිර්මාණය කරන ලද කොල්ලකරුවා විසින් පරිශීලකයා අන්තර්ජාලය හා සම්බන්ධ වන අවස්ථාවේ දී ඔහු නොමග යවමින් වෙනත් වෙබ් පිටු වෙත එම සම්බන්ධතාව යොමු කරනු ලබයි. මෙය ඇඩ්වෙයා තර්ජනය හා සමාන වේ

# ෆිෂින්
# (Phishing)



ෆිෂින් ප්‍රහාර යනු පරිශීලකයන් රවටා ඔවුන්ගේ බැංකු ගිණුම් හෝ විද්‍යුත් ගිණුම් ආදියෙහි තොරතුරු ලබා ගැනීමයි. මේ සඳහා විද්‍යුත් ලිපි යොදා ගැනෙයි. මෙම ලිපි ප්‍රසිද්ධ සමාගමක් හෝ මිත්‍රයෙකුගේ නාමයෙන් පරිශීලකයා වෙත එවනු ලබන අතර වෙනත් වෙබ් අඩවියකට යාම සඳහා සම්බන්ධකයක්ද එවනු ලැබේ. එම සම්බන්ධකය ක්ලික් කිරීමෙන් හෝ විස්තර පත්‍රිකා පිරවීමෙන් ලබා ගන්නා තොරතුරු පරිශීලකයන්ගේ මුදල් සහ වැදගත් තොරතුරු සොරකම් කිරීමට භාවිත කෙරේ.

# ආයාචිත තැපෑල
## (Spam)



අනවසරයෙන් ලැබෙන විද්‍යුත් තැපැල්, ආයාචිත තැපෑල ලෙස හැඳින්වේ. මේවා බොහෝ විට භාණ්ඩ සඳහා වූ වෙළෙඳ දැන්වීම් හෝ නොහඳුනන අයෙකු විසින් එවන ලද විද්‍යුත් තැපෑලක් ද විය හැකි ය. මේ හේතුවෙන් තැපැල් ගිණුම් පිරීයාම නිසා පරිශීලකයා අපහසුතාවට පත්විය හැකි ය. එසේ ම පුද්ගලයින්ගේ විද්‍යුත් ලිපින වංචා සහගතව ලබා ගනිමින් නොයෙකුත් මුදල් වංචා සඳහා පෙළඹවීමට එවනු ලබන විද්‍යුත් තැපැල් ද, ආයාචිත තැපෑල වේ.


Thank you